www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

**10 ශ්‍රේණිය** | **නර්තනය** | **20 - කථකලී නර්ථනය**

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) කථකලි නර්තන ක්‍රමය,

1) උතුරු ඉන්දියානු නර්තන ක්‍රමයකි 2) දකුණු ඉන්දියානු නර්තන ක්‍රමයකි.
3) තන්ජෝර් ප්‍රාන්තයේ ප්‍රචලිතය. 4) මහා රාෂ්ටයේ නර්තන ක්‍රමයකි.

02) කථකලි නර්තන සම්ප්‍රදාය,

1) උත්තර භාරතයේ කල්කටා ප්‍රදේශයේ ප්‍රභවය ලැබුවකි.
2) දක්ෂිණ භාරතයේ තමිල්නාඩු ප්‍රදේශයේ ප්‍රභවය ලැබුවකි.
3) උත්තර භාරතයේ මධ්‍යම ප්‍රදේශයේ ප්‍රභවය ලැබුවකි.
4) දක්ෂිණි භාරතයේ කේරළ ප්‍රදේශයේ ප්‍රභවය ලැබුවකි.

03) කථකලී බිහිවීමට මුල් වූ ප්‍රධාන ගැමි නාටක ක්‍රමයකි,

1) චක්කියාර් කුත්තු 2) මෝහිනී ආට්ටම්
3) තේරුක්කුත්තු 4) ජාත්‍රා

04) කේරළයේ ප්‍රචලිත වූ කථකලි නර්තන සම්ප්‍රදාය බිහිවීමට මූලික වූ ප්‍රධාන ආගමික නාට්‍ය දෙක කුමක්ද?

1) රාමනාට්ටම් සහ කුඩියාට්ටම්
2) මෝහිනී ආට්ටම් සහ දාසි ආට්ටම්
3) මෝහිනී ආට්ටම් සහ තුල්ලල් ආට්ටම්
4) රාමනාට්ටම් හා ක්‍රිෂ්ණනාට්ටම්

05) කථකලී නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කරන්නේ,

1) තබ්ලාව 2) මෘදංගය 3) චෙණ්ඩාව 4) සාරංගලිය

06) කථකලි නර්තනයේ අනු ගායකයා හඳුන්වන්නේ කුමන නමින්ද?

1) තිල්ලානා 2) පොන්නානි 3) සැමොරින් 4) සිංකිටි

07) කථකලි සඳහා වස්තු බීජ සපයාගෙන ඇත්තේ කුමන ග්‍රන්ථවලින් ද?

1) ගීත ගෝවින්දය සහ අභිනය දර්පනය
2) භගවත් ගීතාව සහ නාට්‍ය ශාස්ත්‍රය
3) මහාභාරතය සහ රාමායනය
4) වේද ග්‍රන්ථ සහ පුරාණ ග්‍රන්ථ

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

Agaram.LK - Keep your dreams alive!

08) කථකලි නර්තනයෙහි ප්‍රවර්ධනයට අනුග්‍රහය දක්වූ මහා කවියෙකි,

1) රවීන්ද්‍රනාත් තාගෝර්තුමා
2) වල්ලතෝල් නාරායන මෙනන්
3) සරෝජිනී නායිදු
4) රාහු ගෝපාල්

09) කථකලි නර්තනය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) කථකලි නලුවෙකුට සුඛනම්‍ය සිරුරක් තිබිය යුතුය.
2) චෙණ්ඩාව හා මද්දලය ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වේ.
3) දේව විශ්වාසය මත පදනම්ව ඇත.
4) කථකලි නර්තන ශිල්පියා විසින්ම ගායනයේ යෙදිය යුතුය.

10) කථකලි නර්තනයේ එන අංග රචනා ශිල්පියා හඳුන්වන නාමය කුමක් ද?

1) පොන්නානි
2) සිංකිටි
3) පත්තුකාරන්
4) කේලිකෝත්තු

11) කථකලි රංගනයනක දී ප්‍රධාන ගායකයා අනු ගායකයා විසින් වාදනය කරන වාද්‍ය භාණ්ඩ පිළිවෙලින් සඳහන් වන පිළිතුර තෝරන්න.

1) චෙණ්ඩාව - මද්දලය
2) මද්දලය - ඉඩැක්ක
3) පබ්වාජ් - කුම්භු
4) චෙන්ගිලම් - ඉලකාලම්

12) සිංහල නර්තනයෙහි එන මංගල භේරි වාදනයට සමාන කථකලි රංගනයකදී එන දෙවියන් උදෙසා පූජෝපහාර දක්වන භේරි වාදන අංගය කුමන නමකින් හඳුන්වයිද?

1) අරංගු කෙළි
2) කේලිකෝට්ටු
3) මේලපන්දම්
4) පුරප්පාඩ්

13) කථකලි රංගනයකදී දක්නට ලැබෙන ප්‍රථම පූජා නර්තන අංගය නමකින් හඳුන්වයි ද?

1) මේලප්පදම්
2) තෝඩායම්
3) පුරප්පාඩ්
4) අරංගු කෙළි

14) කථකලි නර්තනයට උගන්වන ගුරුවරයා හඳුන්වන්නේ කුමන නමකින් ද?

1) නට්ටුවනාර්
2) පත්තුකාරන්
3) ආසන්
4) චූටි පූ

Agaram.LK - Keep your dreams alive!

- **නිවැරදි පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.**

15) කථකලි නර්තනට දක්ෂිණ භාරතයේ ............................................... ප්‍රාන්තරයේ ප්‍රභවය ලැබූවකි.

16) ............................................... සංගීත සම්ප්‍රදාය මත ගොඩනැගුණු කථකලි හි ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ............................................... වේ.

17) කථකලි ............................................... අභිනයෙන් පොහොසත් නර්තන සම්ප්‍රදායකි.

18) කථකලි නර්තනය උගන්වනු ලබන ආයතනය ............................................... ලෙස හඳුන්වන අතර එය පිහිටා ඇත්තේ ............................................... නම් ග්‍රාමයේය.

19) කථකලී නර්තනයෙහි එන ප්‍රධාන ගායකයා ............................................... වේ.

20) කථකලි නර්තනය පුහුණු කරවීම සඳහා වල්ලතෝල් නාරායන මෙනන් පඬිතුමා ආරම්භ කළ ආයතනය ............................................... යනුවෙන් හඳුන්වයි.

21) කොට්ටාරක්කාර තාම්පුරන් රජු විසින් ............................................... නම් වූ නර්තනාංගය නිර්මාණය කරන ලදි.

22) රාම, අර්ජුන වැනි චරිත අංග රචනය කරනු ලබන්නේ ............................................... නමැති අංග රචනා ක්‍රමය යොදා ගනිමිනි.

23) කථකලි නර්තනයේ දී උඩුකය නිරුවත්ව තබන්නේ ............................................... නමැති චරිත වෙස් ගැන්වීමේදී ය.

24) කථකලී නර්තනයේ පණ්ඩිකරුවන්, රථාචාර්යවරුන් වැනි චරිත අංගල රචනය කිරීමේදී ............................................... ක්‍රමය යොදා ගනී.

25) කථකලී නර්තනයේදී යක්ෂ, රාක්ෂ වැනි බිහිසුණු චරිත අංග රචනය කිරීමේදී ............................................... නමැති ක්‍රමය යොදා ගනී.

26) කැලිකට්හි රාජා ජමෝරින් රජු විසින් ............................................... නැමති ගැමි නාටක ක්‍රමය කරවන ලදි.

27) කථකලි නර්තනයෙහි ''රාම'' වැනි චරිත යොදා ගන්නා හිස් පළඳනාව ............................................... ලෙස හඳුන්වයි.

28) චෙණ්ඩා බෙරයට අමතරව කථකලී නර්තනය සඳහාද ............................................... සහ ............................................... වැනි අවනද්ධ වාද්‍ය භාණ්ඩ යොදා ගනී.

29) නලුවාගේ මුහුණ මත හාල්පිටියෙන් සකස් කළ පල්ප විශේෂය ............................................... නමින් හඳුන්වනු ලබයි.

30) කථකලී වේදිකාවේ දක්නට ලැබෙන පොල්තෙල් පහන ............................................... නමින් හඳුන්වනු ලබයි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

31) කථකලි නර්තනාරම්භයට පෙර අත් උදව්කරුවන් දෙදෙනෙකු විසින් අල්ලා සිටින තිරය .................................................. ලෙස හඳුන්වයි.

32) කථකලි කාන්තා චරිත .................................................. ලෙස හඳුන්වයි.

- **පහත සඳහන් සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

33) "කථකලි" යන වචනයේ අරුත කුමක් ද?

34) කථකලි නර්තනය ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.

35) කථකලිහි රංග වස්ත්‍රාභරණ කට්ටලයේ කොටස් 05 ක් නම් කරන්න.

36) කථකලි හි වේෂ නිරූපණ ක්‍රම නම් කරන්න.

37) කථකලි නර්තනයේ අංග රචනා ක්‍රම පිළිබඳව විස්තර කරන්න.

38) කථකලී නර්තනයේ ප්‍රභවයට බලපෑ ගැමි නාටක 04 ක් ලියන්න.

39) වල්ලතෝල් නාරායන මෙනන් පිළිබඳව වාක්‍ය දෙකකින් හඳුන්වන්න.

40) කථකලි නර්තනයේ කතා පුවත් සඳහා තේමා වූ ග්‍රන්ථ 03 ක් නම් කරන්න.

41) තාඩි (රැවුල්) වර්ග 03 ක් නම් කරන්න.

42) කථකලි නර්තන සම්ප්‍රදාය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

Agaram.LK - Keep your dreams alive!

සැකසුම:- නවමල් ජයවීර මයා